www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ලෙබනනය පිළිබඳ රෝම සමුලුව

# 2006 සමමුතිය : යුරෝපය ඇමරිකානු-ඊස්රායල ආක්‍රමනයට යටත් වෙයි

**Rome conference on Lebanon**

**Appeasement 2006: Europe capitulates to American-Israeli aggression**

**කර්තෘ මන්ඩලයේ ප්‍රකාශය**

**2006 ජුලි 27**

ලෙබනනයට එල්ල වූ ඊස්රායල ප්‍රහාරය නිසා ඇති වූ අර්බුදය පිලිබඳව සලකා බැලීම පිනිස බදාදා රෝමයේ පැවති ජාත්‍යන්තර සමුලුව සටන් විරාමයක් සඳහා කැඳවුම් කිරීමක් නැතිව ම අවසන් විය. බොහෝ පුවත්පත් වාර්තාවන්ට අනුව, සිවිල් වැසියන් 500කට ආසන්න සංඛ්‍යාවක මරනයට ද රටේ යටිතල පහසුකම් බොහොමයක විනාශයට ද හේතුවූ, ඊස්රායල ආක්‍රමනය හැකි ඉක්මනින් අවසන් කල යුතු යැයි යෝජනා කරන කවර හෝ ආකාරයක සඳහනක් සමුලු ප්‍රකාශනය තුල ඇතුලත් කිරීමට විරෝධය පල කරමින් එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් සමුලුවේ දී තනිව ම මෙන් නැගී සිටියා ය.

ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන් පුවත්පතට අනුව, " යුරෝපයේ හා අරාබිකරයේ ආන්ඩු මෙන් ම එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අනන් සහ යුරෝපා සංගමයේ විදේශ ප්‍රතිපත්ති පිලිබඳ ප්‍රධානියා වන ජාවියර් සොලානා ද ක්ෂනික සටන් විරාමයක් උදෙසා බලගතු පෙලඹවීමක් කල නමුදු, රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් සිය මතයේ ම දැඩිව සිටි හෙයින් එම උත්සාහය අසාර්ථක විය. 'සාමය ස්ථාපනය කිරීම' පිලිබඳ ගිවිසුමක් ඇති විය යුත්තේ සටන් නවත්වන ලෙස අදාල පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටීමට පෙර ය යන ආස්ථානයක ඇය එල්බ සිටියා ය."

එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රන්සය, ස්පාඤ්ඤය, ජර්මනිය, කැනඩාව, රුසියාව, තුර්කිය, ලෙබනනය, සවුදි අරාබිය, ඊජිප්තුව හා ජෝර්දානය යන රටවල ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයන් මෙන් ම එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අනන් ද සමග රැස්වීමට සහභාගි වූ ලෙබනන අගමැති ෆුවාඩ් සිනියෝරා, සතුරුකම් වහා ම නැවැත්විය යුතු යැයි උනන්දු සහගතව ඉල්ලා සිටි හැගීම්බර හා ව්‍යක්ත කතාවක් කලේ ය.

සිනියෝරා මෙසේ ඇසී යః "අන් කවර හෝ රටක වැසියන්ට වඩා ලෙබනන වැසියන්ගේ මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම අඩු ද? අපි පහල මට්ටමේ දෙවියෙකුගේ දරුවෝ ද? ඊස්රායල ජාතික කඳුලු බිඳුවක් ලෙබනන ජාතික ලේ බිඳුවකට වඩා වටිනවාද?"

ඊස්රායලය තම රට "කුඩු පට්ටම් කරමින්" සිටින්නේ යැයි කියූ ඔහු, ඊට එරෙහිව නීතිමය පියවර ගන්නා බව තරයේ කියා සිටියේ ය. ඊස්රායලය යුද අපරාධවල වරදකරුවෙකැයි අඟවමින් ඔහු පැවසුවේ, "එය (ඊස්රායලය) අප මත පමුනුවා ඇති ම්ලේච්ඡ විනාශය" සඳහා යුද වන්දි ලබා ගැනීමට තමන් උත්සාහ කරන බව යි. හේ සිය කතාව සමාප්ත කලේ රෝමානු ඉතිහාසඥ ටැසිටස්ගේ සඳහනක් උපුටා දක්වමිනි. ඔහු පැවසුවේ එමගින් අද දවසේ ඊස්රායලය ලෙබනනයට කරන්නේ කුමක් ද යන්න පෙන්නුම් කෙරෙන බව යි. ටැසිටස් සඳහන් කර තිබුනේ, "ඔවුන් මහත් විනාශයක් ඇති කර එය සාමය නමින් හඳුන්වනවා" යන්න යි.

එක් පුවත්පත් වාර්තාවකට අනුව, සිනියෝරාගේ කතාවෙන් පසු සාකච්ඡා කාමරය පුරා ඒ පිලිබඳ පැහැදිලි උද්වේගයක් පැවති බව රාජ්‍ය තාන්ත්‍රිකයෝ ප්‍රකාශ කලහ. කෙසේ වුව ද රයිස්ගේ ආස්ථානය වෙනස් වූයේ නැත. රැස්වීමෙන් අනතුරුව පැවති පුවත්පත් සාකච්ඡාවක දී සිනියෝරාගේ "අතිශය හැගීම්බර" කතාව පිලිබඳව සඳහන් කල ඇය, ලෙබනනයේ ප්‍රධාන නගර, නගර හා ගම්මානවලට ඊස්රායලය එල්ල කරන ප්‍රහාර අත්හිටුවීමක් කෙරෙහි වන තම විරුද්ධත්වය යලි යලිත් පල කලා ය. එමෙන් ම, දකුනු ලෙබනනයට යන ඕනෑ ම ජාත්‍යන්තර හමුදාවක අරමුන විය යුත්තේ හිස්බුල්ලා සටන්කරුවන් නිරායුධ කිරීම බව ද ඇය අවධාරනය කලා ය.

එක්සත් ජනපදයේ මදාවිකාරකම ද යුරෝපයේ අබලදුබල බව ද යන දෙක ම රෝම සමුලුවෙන් පෙන්නුම් කෙරින. ඊස්රායලය හා එක්සත් ජනපදය ලෙබනනය තුල කර ගෙන යන්නේ කුමක් ද යන්න පිලිබඳව රැස්වීම් කාමරයේ සිටි සියල්ලෝ ම මැනවින් දැන සිටියහ. ඊස්රායලය දේශ සීමාවේ ලෙබනන පාර්ශ්වයෙහි වූ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂන මුර

පොලකට බොහෝ ඈතක සිට පැහැදිලිව ඉලක්ක කොට දුර විදින මිසයිල ප්‍රහාරයක් එල්ල කර තිබුනේ ඊට පෙර දිනයේ ය. එමගින් එක්සත් ජාතීන්ගේ නිරීක්ෂකයන් සතර දෙනෙකු ඝාතනයට ලක්ව තිබින.

ඊස්රායලය යුද්ධය කර ගෙන ගිය ද දුනුදිය අදින්නේ එක්සත් ජනපදය බව සමුලුව තුල දී රයිස් ඉටු කල ක්‍රියා කලාපයෙන් සුපැහැදිලි ලෙස පෙනී ගියේ ය.

රයිස්ට විරුද්ධව නැගී සිටීමට තරම් වන මූලධර්මාත්මක පදනමක් හෝ දිරි සම්පන්න භාවයක් සමුලුවට සහභාගි වූවන් කිසිවෙකු සතුව නොතිබින. එහි දී සටන් විරාමයක් පිලිබඳ කිසිදු යෝජනාවක් ඉදිරිපත් නොවූයේ ඇයි? එයට එරෙහි වූයේ එක්සත් ජනපදය නිසා ය; 'වලංගු' ඡන්දයක් තිබුනේ එක්සත් ජනපදයට පමනක් නිසා ය.

සමස්ත යුරෝපා ධනේශ්වරය ද එමෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානය ද, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ඉදිරියේ තමන් පත් වන අබලදුබල තත්ත්වය යලි වතාවක් ප්‍රදර්ශනය කලේ ය. වෙලඳාම පිලිබඳ කරුනුකාරනාවලට පිවිසි කල එක්සත් ජනපදයට විරුද්ධව තර්ජනාත්මකව නැගී සිටීමට යුරෝපය සූදානම් ය - ඒ මුදල් සම්බන්ධයෙන් කේවෙල් කිරීමට යි - එහෙත් දැවැන්ත හා ඓතිහාසික අපරාධ අබිමුවෙහි එය පරිපූර්න බියගුලුකම ප්‍රදර්ශනය කරයි. ඇත්ත වශයෙන් ම ඔවුහු ද මේ අපරාධවල හවුල්කරුවෝ ය.

නිල දේශපාලන ක්ෂේත්‍රයේ සිටින කවර පක්ෂයක් හෝ කන්ඩායමක් සම්බන්ධයෙන් ගත්ත ද පෙනී යන සත්‍යයක් වන්නේ ඊනියා "වාම" ආන්ඩු සහ ඔවුන්ගේ දක්ෂිනාංශික කොටස්කරුවන් අතර කිසිදු වෙනසක් නොමැති බව යි. එක්සත් ජනපද ඊස්රායල යුද පිලිවෙතට නිල මුද්‍රාව යොදා ගැනීමේ අරමුනෙන් වොෂින්ටනය කල කැඳවුම අනුව සැලසුම් කල රැස්වීමේ සත්කාරකයා වීමට රොමානෝ ප්‍රෝඩිගේ ඉතාලියානු මධ්‍ය-වාම ආන්ඩුව එකග් වූයේ එබැවිනි. එය ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂයේ මරන මංචකයේ දී මතුව ආ පක්ෂ දෙකක් වන වාම ඩිමොක්‍රැටික් පක්ෂය හා කමියුනිස්ට් රීෆවුන්ඩේෂන් පක්ෂය ඇතුලත් සභාගයකි. කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රවීනයෙකු හා වර්තමාන විදේශ ඇමතිවරයා ද වන මසිමෝ ඩි'අලීමා රැස්වීමේ දී ඇමරිකානු රාජ්‍ය ලේකම්වරිය හමුවේ විශේෂිත නියාලු බවකින් යුතුව ක්‍රියා කලේ ය.

අනතුරුව ඉදිරිපත් වූයේ, සිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිරීක්ෂකයන් සැලසුම් සහගතව ඉලක්ක කොට ගනිමින් ප්‍රහාර එල්ල කිරීම පිලිබඳව කලින් දා ඊස්රායලයට චෝදනා කල කොෆි අනන්ගේ අදහස යි. රයිස් පසෙකින් හිඳ ගෙන ඔහු ඊස්රායලයේ වගකීම් විරහිත ක්‍රියාවන් ද නරුම ක්ෂමාලාපය ද අනුමත කලේ ය.

ලෙබනනයට එරෙහි එක්සත් ජනපද පිටුබලය ලද කුරිරු යුද්ධය ද ඊට විරුද්ධත්වය පල කිරීම සඳහා ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයන්ට ඇති නොකැමැත්ත හෝ නොහැකියාව ද මගින් සලකුනු කෙරෙන්නේ, ජාත්‍යන්තර නීතිය පිලිබඳව දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ඇති කර ගන්නා ලද සැකැස්ම බිඳ විසුරුවා ලීමේ සන්ධිස්ථානයකි. ලෝකය යලි වතාවක් සාක්ෂ්‍ය දරමින් සිටින්නේ, 1930 ගනන් සංලක්ෂනය කලා වූත් දෙවන ලෝක යුද්ධයෙන් නිමාව දුටුවා වූත් අධිරාජ්‍යවාදයේ අබාධිත මදාවිකාරකම හා ප්‍රචන්ඩකාරිත්වය සම්බන්ධ අවගමනයකට ය.

රෝමයේ පැවති රැස්වීමට සිනියෝරා ඉදිරිපත් කල නිරර්ථක ආයාචනය, හරියට ම මීට 70 වසරකට පෙර හට ගත් සිදුවීමක් යලි සිහිපත් කරයි. ඒ 1936 ජූනි මස ඉතියෝපියානු අධිරාජයා වූ හයිලි සෙලාසි ජාතීන්ගේ සංගමය ඉදිරියේ කල කතාව යි. ෆැසිස්ට් ඉතාලිය විසින් තම රටට එරෙහිව කරන ලේ වැකි ආක්‍රමනය නතර කිරීමට පියවර ගන්නා ලෙස එහි දී සෙලාසි ලෝක නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. එහෙත් ජාතීන්ගේ සංගමය කල දෙයක් නැත.

එය ආසියාව තුල කලාපීය ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා ජපානය පෙරට තල්ලු වූ, එමෙන් ම ලෝක පරිමාන ව්‍යසනයකට තුඩු දුන් ප්‍රහාරයක පෙරටුව යුරෝපයේ ආධිපත්‍යය සඳහා ජර්මනිය පෙරට තල්ලු වූ කාල පරිච්ඡේදය යි. එහෙත් අද දින ප්‍රධාන ආක්‍රමනිකයාගේ භූමිකාව රඟ දක්වන්නේ මුලු මහත් ලෝකය මත ම සිය ආධිපත්‍යය පිහිටුවා ගැනීමට අධිෂ්ඨානශීලීව සිටින එක්සත් ජනපදය යි. වොෂින්ටනය සම්බන්ධයෙන් ගත් කල, මැද පෙරදිග හා මධ්‍යම ආසියාව ප්‍රතිව්‍යුහගත කිරීම වනාහී ගෝලීය ආධිපත්‍යය හඹා යන තම ගමනේ තීරනාත්මක සංරචකයකි. ඇමරිකානු පාලක ප්‍රභූව කලාපීය ආධිපත්‍යය සඳහා ඊස්රායලය දරන පරිශ්‍රමය දෙස බලන්නේ, තමන්ගේ ම ගම්භිර වූත් වියරු සහගත වූත් සැලසුම යටතේ සාක්ෂාත් කර ගැනීම පිනිස පාවිච්චියට ගත හැකි යම් දෙයක් ලෙස ය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු දශක ගනනාවක් යන තුරු ම, 1930 ගනන්වල දී ප්‍රධාන ලෝක බලවතුන් ජර්මානු අධිරාජ්‍යවාදයට යටත් වීම "වන්දිභට්ට පිලිවෙතක්" යැයි හෙලා දකින ලදි. එනම්, ජාත්‍යන්තර නීතියට එරෙහිව නාසින් එල්ල කල නින්දිත හා සාහසික ප්‍රහාරයට විරුද්ධව ප්‍රතිචාර දැක්වීම ඔවුන් විසින් ප්‍රතික්ෂේප කිරීම යි. එහෙත්, එක්සත් ජනපදයට වන්දිභට්ටකම් කිරීම පිලිබඳ යුරෝපා පිලිවෙතක ස්වරූපයෙන්, යටත් වීමේ එම මාදිලිය එතරම් ම ප්‍රබල ලෙස අද දින ද යලි මතු වී ඇත.

රෝමයේ පැවති සමුලුවෙන් ලද ප්‍රතිඵලය මගින් අවධාරනය කෙරෙන්නේ, හිස්බුල්ලා සංවිධානය මිලිටරිමය වශයෙන් විනාශ කිරීමේ පදනම මත ලෙබනන අර්බුදය සමථයකට පත් කිරීමට එක්සත් ජනපදය උත්සාහ කරන්නේ ය යන කරුන යි. මෙය වනාහි, ලෙබනනය කෙරෙහි එක්සත් ජනපදය ආධිපත්‍යය පැතිරවීමට එරෙහිව පැන නැගෙන මහජන ප්‍රතිරෝධය සමස්තයක් ලෙස තලා දමා එය සැබවින් ම ඊස්රායල පාලන වැයික්කියක් බවට පත් කිරීමේ අරමුනෙන්, ඇමරිකාව හා ඊස්රායලය එක් වී හොඳින් සිතා බලා දිගු කලක් තිස්සේ සූදානම් කරන ලද සැලසුමක කොටසකි.

හිස්බුල්ලා සංවිධානය මර්දනය කිරීම වනාහි සිරියාව හා ඉරානය සමග පැටලෙන කරුනක් ය යන්න ගැන එක්සත් ජනපදය සැලකිලිමත්ව සිටී. ඒ අනුව, තෙල් සම්පතින් සපිරි මැද පෙරදිග හා මධ්‍යම ආසියාව තුල ඇමරිකානු ආධිපත්‍යය පිහිටුවීමට එරෙහි බාධකයක් ලෙස සලකනු ලබන එම පාලන තන්ත්‍රයන් දෙක මුලිනුපුටා දැමීම සඳහා වන ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ගේ ඉලක්කය සම්බන්ධයෙන්, එය තීරනාත්මක වැදගත්කමක් දරන බව පෙනේ.

තනි සිදුවීමක් ලෙස ගත් විට, මෙම අධිරාජ්‍යවාදී මෙහෙයුම දියත් වීම සඳහා වූ ව්‍යාජ පසුබිම වශයෙන් යොදා ගත්තේ ඊස්රායල සොල්දාදුවන් දෙදෙනෙකු අල්ලා ගනිමින් හිස්බුල්ලා සංවිධානය ජුලි 12 දා සිදු කල දේශ සීමා ආක්‍රමනය යි.

යථාර්ථය උඩු යටිකුරු කිරීමේ අරමුනෙන්, ආක්‍රමනිකයන් ගොදුරු වූවන් ලෙසත් ගොදුරු වූවන් යුදවැද්දන් ලෙසත් මවා පාමින් මාධ්‍ය ප්‍රචාර ප්‍රවාහයක් ගෙන යාමෙන් මෙම කරුනුකාරනා ක්‍රමානුකූලව හා හිතාමතා යට ගසන ලදි. වචනවල සැබෑ අරුත් පැහැර ගෙන, තොරතුරු සැපයීම වෙනුවට ව්‍යාකූල කිරීමට හා සඟවා තැබීමට ඒවා උපයෝගී කර ගන්නා ලදි.

වොෂින්ටනයේ හා ජෙරුසලමේ යුද අරමුනුවලට යටත් නො වුන හොත් සමූල ඝාතනය කරන බවට තර්ජනය කරමින් ඒ සඳහා එකගවන ලෙස හිස්බුල්ලා සංවිධානයට අවසන් නිවේදන නිකුත් කිරීමේ එක්සත් ජනපද ප්‍රතිපත්තියට "රාජ්‍ය තාන්ත්‍රික භාවය" යොදා ගැනින. මැද පෙරදිග හා යුරෝපය වෙත රයිස් ගිය දූත ගමන "සාම උදෙසා ගිය දූත ගමනක්" ලෙස වගවර්නනා කෙරුනු නමුදු, ඇයගේ ප්‍රථම වූත් ප්‍රමුඛ වූත් අරමුන වී තිබුනේ යුද්ධය දිගට ම පවත්වා ගෙන යාම හා ලෙබනන ප්‍රතිරෝධය - එමෙන් ම ගාසා තීරයෙහි පවතින පලස්තීනයන්ගේ ප්‍රතිරෝධය ද - සහමුලින් වනසා දැමීම සඳහා ඊස්රායලයට හැකි තරම් කාලය ලබා දීම යි.

එක්සත් ජනපද හා ඊස්රායල ආධිපත්‍යයට ප්‍රතිරෝධය පාන සියල්ලන් සඳහා ම "ත්‍රස්තවාදියා" යන සර්වව්‍යාපී පදය යොදා ගැනේ. කෙසේ වුව ද සැබවින් සිදු වන්නේ ඊස්රායලය සිය මිලිටරි ප්‍රහාරය දියත් කරමින් ලෙබනන මහජනතාව ත්‍රස්ත කිරීම නො වේ ද?

දේශපාලන පෙරලියක් හෝ මිලිටරි ප්‍රහාරයක් සිදු කල යුතු යැයි එක්සත් ජනපදය විසින් තෝරා ගන්නා ඕනෑ ම ඉලක්කයකට එරෙහිව "ත්‍රස්තවාදියා" යන වචනයෙන් දමා ගැසීම දැන් සැබවින් ම වැඩි වැඩියෙන් සිදු වෙයි. වරක් මේ හංවඩුව ගැසූ පසු, එලෙස හංවඩු ගැසූ රටේ හෝ කන්ඩායමේ ඉතිහාසය, ප්‍රතිපත්ති හෝ සාමාජීය ව්‍යුහය සම්බන්ධයෙන් කෙරෙන සියලු වැඩිදුර සාකච්ඡාවන්හිදී එය අවජාතකයෙකු යැයි සලකනු ලැබේ. ඉලක්ක කර ගත් සංවිධානය හෝ රට මේ ලඟ දී පවා "හොඳ සගයන්" අතරේ සිටියද මෑතම "ත්‍රස්තවාදී තර්ජනය" පිලිබඳ භීතිය නිර්මානය කිරීමේදී අලස හා කීකරු මාධ්‍යයන් මත රැඳී සිටීමට එක්සත් ජනපද ආන්ඩුවට හැම විට ම හැකියාව තිබේ.

වත්මන් සිද්ධියේදී, හිස්බුල්ලා සංවිධානය ඔසාමා බින් ලාඩන්ගේ හා අල් කයිඩා සංවිධානයේ දැඩි දේශපාලනික විරුද්ධවාදියෙකැයි යන කරුන මගින් සකලවිධ ආකාරයෙන් කර ගෙන යන මෙම ප්‍රචාරක උපක්‍රමයේ පවතින විකාරරූපී බව අවධාරනය වේ.

මේ සියල්ල සැලසුම් කරනු ලැබුනේ ඇමරිකානු ජනතාව එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තියේ මදාවිකාර හා ලේ වැකි ස්වභාවය අවබෝධ කර ගැනීම වලක්වා ලීම පිනිස ය. එය සමස්ත දේශපාලන සංස්ථාපිතය මත් රිපබ්ලිකානුවන් හා උරෙනුර ගැටෙමින් ඩිමොක්‍රැටිකයන් විසින් මත් සහාය දෙනු ලබන ප්‍රතිපත්තිය යි. මහජනයා අතරින් පලල් කොටසකට ඇමරිකානු හා ඊස්රායල ප්‍රචන්ඩත්වයේ පරිමානයත් ඔවුන්ගේ ආක්‍රමනයේ නිර්ලජ්ජිත ස්වභාවයත් මුලුමනින් ග්‍රහනය කර ගැනීම දුෂ්කර ය.

දශක ගනනාවක් තිස්සේ එක්සත් ජනපදය ජාත්‍යන්තර නීතියේ ආරක්ෂකයා යැයි මවා පෙන්වන ලදි. පශ්චාත් දෙවන ලෝක යුද සමය තුල, කලාපීය ගැටුම්වල දී එය සටන් විරාමයන්ට පොදුවේ සහාය දුන්නේ ය. සාකච්ඡා මගින් දේශපාලන විසඳුමක් ඇති කර ගැනීම සඳහා වූ මූලික පූර්ව කොන්දේසියක් ලෙස සටන් විරාමයන් සැලකිල්ලට ගන්නා ලදි.

ඒ යුගය හමාරව තිබේ. වැඩි වැඩියෙන් මතු වී පෙනෙන්නේ අධිරාජ්‍යවාදී අභිප්‍රායයන් නිර්බාධිතව තහවුරු කර ගන්නා ආකාරය යි. මෙහි ප්‍රධාන භූමිකාව ඉටු කරන්නේ එක්සත් ජනපදය යි. බුෂ් පරිපාලනය ගෙන ආ පූර්වභංග යුද්ධය පිලිබඳ මතවාදයේ පවතින ආවශ්‍යක වැදගත්කම එය යි. ලෙබනනය තුල සිදු වන

වත්මන් ඝාතන ක්‍රියාවලිය මගින් පෙන්නුම් කරන පරිදි, ඇමරිකානු පාලක ප්‍රභූව සම්බන්ධයෙන් ගත් කල යුද්ධය යනු විදේශ පිලිවෙතේ නීත්‍යානුකූල අංගයක් පමනක් ම නො වේ; එය සිය අවශ්‍යතා තහවුරු කර ගැනීමට ඔවුන්ට ඇති වඩා ම සුදුසු මාධ්‍යය ද වේ.

සිය වර්තමාන ආක්‍රමනයේ දී එක්සත් ජනපදය හා ඊස්රායලය මුහුන දී සිටින ගැටලුව වන්නේ ඔවුන් ලෙබනනයෙන් එල්ල වන ප්‍රතිරෝධයේ ගැඹුර අවතක්සේරු කිරීම යි. එක්සත් ජනපදය විසින් සන්නාහ සන්නද්ධ කරන ලද ඊස්රායල මිලිටරිය, තමන් දකුනු ලෙබනනයෙහි කල පාබල මෙහෙයුම්වල දී සැලකිය යුතු සොල්දාදුවන් ගනනක් තුවාල ලැබීමෙන් පීඩාවට පත්ව සිටී. එහි දී එය දැවැන්ත මහජනතා සහයෝගයක් සහිත හිස්බුල්ලා සංවිධානය වෙතින් එල්ල වූ අධිෂ්ඨාන සහගත වූත් විනයගත වූත් විරෝධයකට මුහුන දුන්නේ ය.

කෙටි කාලීන හා ලේ වැකි යුද්ධයක් පිලිබඳව වූ එක්සත් ජනපද හා ඊස්රායල සැලසුම් අතුරුදන්ව ගොසිනි. කෙසේ වුව ද එමගින් සිදු වනු ඇත්තේ, එක්සත් ජනපදයේ පෙලඹවීම මත ඊස්රායලය ලෙබනනය තුල ප්‍රචන්ඩත්වය දැවැන්තව ඉහල නැංවීමට ඇති ඉඩකඩ තව දුරටත් තීව්‍ර වීම පමනි. ඊස්රායලය විසින් එක්සත් ජාතීන්ගේ නිරීක්ෂන මුර පොලකට හිතාමතා බෝම්බ හෙලීම මගින් මේ පිලිබඳ සංඥාවක් දැනට මත් ලැබී තිබේ.

ඊස්රායලයේ අපරාජිත බව පිලිබඳ මිථ්‍යාව බිඳ දැමෙන ආකාරයේ මිලිටරි මඩ ගොහොරුවකට ඇද වැටීමට එක්සත් ජනපදයට වත් ඊස්රායලයට වත් නොහැකි ය. එබඳු වර්ධනයක් මගින් ඉරාකයේ, ඇෆ්ඝනිස්ථානයේ හා මැද පෙරදිග පුරා සහ මධ්‍යම ආසියාවේ මහජනතාවන්ගේ ප්‍රතිරෝධය දිරිමත් කෙරෙනු ඇත. එහි දී සැකයට බඳුන් වනු ඇත්තේ ඊස්රායලයේ කලාපීය ආධිපත්‍යය පමනක් නො වේ. එක්සත් ජනපදය හා ඊස්රායලය යන දෙක ම පදනම් වී සිටින ජෝර්දානයේ, සවුදි අරාබියේ හා ඊජිප්තුවේ අරාබි ධනේශ්වර තන්ත්‍රයන්ගේ පැවැත්ම ද එහි දී සැකයට බඳුන් වනු ඇත.

ඊස්රායලයට මත් අත් වනු ඇත්තේ ඊට නොඅඩු පුපුරනසුලු ප්‍රතිවිපාකයන් ය. අරාබීන්ගෙන් සර්වව්‍යාපී සමූලඝාතන තර්ජනයක් එල්ල විය හැකි යැයි කියමින් වැඩ කරන ජනතාවන් දාස භාවයෙහි තබා ගැනීමට ඊස්රායල පාලක ප්‍රභූව දරන ප්‍රයත්නය ආශිංසනය ලබන්නේ, පන රැක ගැනීම සඳහා ඇති එක ම සහතිකය ඊස්රායල මිලිටරිය පමනක් ය යන පැහැදිලි කිරීම මගිනි. එම ප්‍රතිරූපයේ බැරෑරුම් බිඳී වැටීමක් සිදු වුව හොත්, පුපුරා යාමට ඉතා ආසන්නව කැකෑරෙමින් පවත්නා සාමාජීය ආතතීන් පිට වන මගක් බවට එය පත් වනු ඇත. ඊස්රායලය යනු ලෝකය තුල පවතින ආර්ථිකව අතිශයින් ම ධ්‍රැවීකරනය වූ සමාජයකි.

වත්මන් යුද්ධයට එරෙහිව ඊස්රායලය තුල ම විරුද්ධත්වය නැග ඒම පිලිබඳ සලකුනු දැනට මත් පවතී. ඊස්රායල හමුදා භටයන්ගේ මරන සංඛ්‍යාව එන්න එන්න ම ඉහල යාම නිසා පමනක් නො ව, ඊස්රායල කම්කරුවන් හා තරුනයන් තමන්ගේ නමින් ලෙබනන මහජනතාව මත පටවනු ලබන විනාශයේ, අවුල් ජාලයේ හා මරනයේ පරිමාව වටහා ගැනීමට පටන් ගැනීම ද නිසා එම විරුද්ධත්වය තව තවත් වර්ධනය වනු ඇත.

1930 ගනන්වලින් ලැබෙන දැවැන්ත හා ඛේදනීය පාඩම නම්, එක් හෝ අනෙක් අධිරාජ්‍යවාදී බලයකට ආයාචනය කිරීමෙන් හෝ කුමන හෝ ජාතික ධනේශ්වරයක් සමග සන්ධානගත වීමෙන් හෝ යුද්ධයේ ව්‍යසනය වැලකිය නොහැකි බව යි; එය කල හැක්කේ මිලිටරිවාදයට හා එය උත්පාදනය කරන ධනපති ක්‍රමයට එරෙහිව වැඩ කරන ජනතාව බලමුලු ගැන්වීමෙන් පමනක් බව යි.

තවත් ගෝලීය ව්‍යසනයක් ඇති වීම වලක්වා ලිය හැකි එක ම බලවේගය වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. අද දින යලි වතාවක් පෙරට එන්නේ මේ පාඩම යි. එය කම්කරු පන්තියේ නව ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීමේ පදනම බවට පත් විය යුතු ය.

© www.wsws.org